www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොරසොන් කොජුඅන්ග්කො අක්විනො, 1933 - 2009

## Corazon Cojuangco Aquino, 1933-2009

**ජෝසප් සන්තොලන් විසිනි**

**2009 අගෝස්තු 4**

**පලමු වන කොටස**

මෙය වනාහි කොටස් දෙකකින් යුක්ත ලිපියේ පලමු කොටස ය.

හිටපු පිලිපීන ජනාධිපතිනිය වූ කොරසොන් අක්විනො අගෝස්තු 1 වන දින කොලොන් පිලිකාවකින් මිය ගියාය.

ප්‍රශස්ති ගායනා සහ ගුන වර්නනාවන් මාධ්‍යයන් තුල ගලාඒමට ආරම්භ වන විට ඇය යන්තම් විනාඩි 30 කට පෙර මිය ගොස් තිබින.

ඇයගේ මරනය කිසිවෙකුටත් පුදුමයක් නොවීය. මාස 18 පුරා පිලිකාවක් සමග පොරබදමින් සිටි ඇයගේ තත්ත්වය පසුගිය සති 6 තුල වඩාත් දරුනු අතට හැරුනි.

මේ ගැහැනියගේ අභාවය සඳහා ප්‍රතිචාරයන් සූදානම් කිරීමට මාධ්‍යයන්ට, සියලුම වර්ගයේ දෘෂ්ටිවාදාත්මක ප්‍රවනතාවන් සහිත දේශපාලන කන්ඩායම්වලට විදේශ රාජ්‍යවල ප්‍රධානීන්ට ද ඇති තරම් කාලය තිබින. ජාත්‍යන්තර මෙන් ම පිලිපීන මාධ්‍ය වල අවමංගල්‍ය පිලිබඳ ව ඓතිහාසික විශ්ලේෂන හිඟ වීම ගැන සමාව දිය නොහැක. ගෘහනියක් වීමට අදි මදි කිරීමත් මාකෝස් තන්ත්‍රයේ මෘගත්වය මගින් දේශපාලනයට පෙලඹීම හා අවිහිංසාවාදී විප්ලවයකින් පාලන බලයට තල්ලු වූ බවට විශ්ව පරිමානව ඔවුන් විසින් අක්විනෝව හුවා දැක්වීම දියාරු පුවත් පත් කලාවත්, ධනේශ්වර නරුමත්වයේ සම්මිශ්‍රනයක් ද, සිතා මතා කරන ලද ඓතිහාසිකව නොතකා හැරීමක් ද වන්නේය.

පිලිපීන දේශපාලකයෝ සත්‍ය ලෙසම ලජ්ජා විරහිත ලෙස අක්විනෝ ගැන ප්‍රශංසා පුද කලහ. පක්ෂ සහ පිලිපීන වාමාංශයේ සුලු ධනේශ්වර සංවිධාන ඇයගේ අවමංගල්‍යය සඳහා වෙන වෙනම තම තමන්ගේ සංවේගයේ ගාම්භීර ප්‍රකාශන නිකුත් කරමින් අක්විනෝ අනුස්මරනය කිරීමේ කුලප්පුවට සම්බන්ධ වූහ. දශක දෙකකට පෙර ඔවුහු අක්විනෝගේ 'ෆැසිස්ට් තන්ත්‍රය' මහ හඬින් හෙලා දුටුවහ. අද ඔව්හු ඇය 'ප්‍රජාතන්ත්‍රවාදයේ කප්පිත්තෙක්' සහ 'ඒකාධිපතිවාදයේ ප්‍රබල ප්‍රතිවාදියෙක්' ලෙස වග වර්නනා කරති.

කොරසොන් අක්විනෝ කොජුඅන්ග්කො පවුලේ සාමාජිකාවකි. පිලිපීනය තුල ආධිපත්‍යය දරන්නේ ස්පාඤ්ඤ යටත් විජිතවාදය තුලදී පෝෂනය වූ වංශාධිපතීන්ගේ පවුල් වල ආර්ථික සහ කතිපයාධිපත්‍යවාදී අවශ්‍යතාවයෝ ය. හෙක්ටයාර් 10,000 ක් ඇතුලුව ටාර්ලක් හි මධ්‍යම ලූසොන් ප්‍රාන්තයේ අති විශාල ගෙවත්තක් සහිත මන්දිරයක් ද මූල්‍ය අවශ්‍යතා මෙන්ම කෘෂිකාර්මික සහ නාගරික දේපල වල අධිරාජ්‍යයක් ද කොජුඅන්ග්කෝ පවුල සතුය.

මෙම ධනය, පෝෂනය වීම ද ඒ සඳහා රැකුල් දීම ද කොජුඅන්ග්කෝවරුන්ගේ දේශපාලන මැදිහත්වීම තුල දී සිදුවිය. කොරසොන් අක්විනෝගේ ජනාධිපතිකමට අමතරව, කොජුඅන්ග්කොවරු ආන්ඩුකාරවරුන්, පුරපතිවරුන්, සෙනේට් සභිකයින් සහ කොන්ග්‍රස් නියෝජිතවරුන් ලෙස සිට ඇත. මෙය ඉඩම්හිමි ප්‍රභූ පැලැන්තියේ ප්‍රජාතන්ත්‍රවාදයේත්, කතිපයාධිකාරී ආර්ථික පාලනයේත් ගති ලක්ෂනයක් වන අතර ස්පාඤ්ඤ සහ ඇමරිකානු විජිතවාදයේ උරුමයකි.

### කතිපතන්ත්‍රයේ සම්භවය

කිසිදු වානිජ්‍යමය ව්‍යාපාරයක්, කර්මාන්ත, පතල් හෝ කෘෂිකර්මය වැනි අංශ වර්ධනය කිරීමේ සත්‍ය අභිලාභයකින් තොරව වසර 350 ක් පුරා යටත් විජිත උරුමයක් ලෙස ස්පාඤ්ඤය විසින් පිලිපීනය පාලනය කලේ ය. මැනිලාව වෙලඳාම සඳහා වානිජ තොටුපොලක් හා ගබඩා සංකීර්නයක් ලෙස භාවිතා කෙරින. අකපුල්කො හි දී මෙක්සිකානු රිදී සඳහා චීන සේද සහ පිඟන් භාන්ඩ හුවමාරු විය. මෙම භාන්ඩ ඉතා අධික මිලකට යුරෝපය තුලදී අලෙවි කෙරින. මෙම වෙලඳාම පරිපාලනය කිරීම තුලින් ඉහලම ලාබ ප්‍රයෝජන විජිත නිලධරයෝ ලැබූහ. මුලුමනින්ම වාගේ පිලිපීන ප්‍රාන්ත ජනයා පාලනය කරනු ලැබුවේ විශාල ඉඩම් හිමි කර ගත් ස්පාඤ්ඤ පූජකවරු විසිනි.

පිලිපීනය හුදකලා කරමින් සහ නිෂ්ඵල තත්ත්වයකට පත් කරමින් 1820 මෙක්සිකානු විප්ලවය මගින් ඵලදායි ලෙස සෙවිල්-අකපල්කො-මැනිල නැව් වෙලඳාම බිඳ දැම්මේය. නොදියුනු පිලිපීනය තුල පැවැති අවස්ථාවන් ඩැහැ ගැනීමට බ්‍රිතාන්‍ය ආයෝජකයෝ කැදරකමින් බලා සිටියහ.

යටත් විජිත කොල්ලකෑම් සහ ප්‍රොතෙස්තන්ත බලපෑම් ගැන බිය වූ, ස්පාඤ්ඤය මැනිලාවලින් පිටත විදේශිකයන් පදිංචිව සිටීම වලකමින් අත්තනෝමතික නීති මාලාවක් පැනවූහ. යුරෝපය තුල නිකුත් කෙරුනු නයවර ලිපි ආවරනය කිරීමට අවශ්‍ය තරම් ප්‍රාග්ධනය සහිත බැංකු නිර්මානය කරමින් වෙලඳාම පහසු කිරීමට බ්‍රිතාන්‍ය ආයෝජකයෝ වානිජ මධ්‍යස්ථාන පිහිටු වූහ. වසරේ වැඩි කාලයක් ප්‍රාග්ධන හිඟකමකට මුහුන දුන් ඔවුහු ආයෝජන සඳහා අවස්ථාවක් සොයා ගැනීමට උත්සුක වූහ. ස්වදේශික ජනතාව වූ ඉන්ඩිඔස් වරුන් ට විශාල මුදල් ප්‍රමානයක් නය ලෙස දීම නීති විරෝධී විය.

දහ අට වන සියවසේ මැද භාගයේ, චීන පිරිමින්ගේ ආගමනය සහ 1850 පසුව දෙවන ආගමනය ආයෝජන අවස්ථාවන් සඳහා බලා සිටි බ්‍රිතාන්‍ය ප්‍රාග්ධනයට අවකාශයක් සැපැයූ අතර ආනයන-අපනයන වෙලඳාමක් සඳහා පැවැති ආර්ථික හිදැස පිරවීය. සංක්‍රමනික තනිකඩයෝ ඉන්ඩිඔස්වරුන් විවාහ කරගත් පසු මෙම පවුල් චීන සංමිශ්‍රිත පවුල් (මෙටිසිසො) වූහ.

යටත් විජිත පරිපාලනයෙන්, ඉන්ඩිඔ ජනතාවගෙන් හා වාර්ගික පලිගැනීම් වලින් බේරීමට මෙම චීන මෙටිසිසො පවුල් ස්පාඤ්ඤ නම්, ස්පාඤ්ඤ භාෂාව, කලා භාන්ඩ, භාෂා ශෛලීන් හා ස්පාඤ්ඤ අගනුවර සංස්කෘතිය භාවිතා කරමින් තමන්ම ස්පාඤ්ඤකරනයට භාජනය කරගත්හ. අලුත් නමක අගට යොදන ගෞරව නාමයක් වන වාසගමක් වූ හොකීනෙසේ කෝ ඇතුලුව - ඒ අනුව පසුව කොජුආන්ග්කො යෙදුන- පරම්පරාවක් තුල දී ඉන්ඩිඕ සහ චීන සම්භවයන්ගේ සියලුම සලකුනු මැකී ගියේ ය.

මෙම මෙටිසිසෝවරු බ්‍රිතාන්‍ය ප්‍රාග්ධනය උපයෝගී කර ගනිමින් හා ගම්බද වැටුප් කම්කරුවන් සහ අඳ ගොවියන් යොදා ගනිමින් පිලිපීනය තුල ධනවාදී කෘෂිකර්මය සහ අපනයන සඳහා තනි භෝග වගාව වේගයෙන් දියුනු කලෝ ය. මෙටිසිසෝවරු මත් කතෝලික පූජකවරුන්ට අයත් විශාල ඉඩම්වල පදිංචිකරුවෝ වූහ. 1869 දී සූවස් ඇල මාර්ගය විවෘත කල විට යුරෝපය සමග ඍජු වෙලඳ සබඳතා ගොඩ නැගුනේය. පිලිපීනය ස්ථිරව ම ලෝක ධනවාදයට ඇඳා ගැනුනි.

1896 දී ස්පාඤ්ඤයට එරෙහි පිලිපීන විප්ලවයෙන් පසුව විජිතවාදී හිමිකම් කෙරෙහි කැදර වූ ඇමරිකාව 20 වන සියවස පුරාම දිවෙන මෘග උද්ඝෝෂනයක් මගින් දූපත් යටත් කර ගත්තේය. තමන් තුන්වන ගනයේ විජිතවාදී බලයක හිමිකමක් වීම ගැන කාලයක් පුරා අමනාප වී සිටි මෙටිසිසෝ කතිපයාධිපතියෝ ස්පාඤ්ඤය සැලකුවේ යුරෝපයේ පිලිකන්නක් ලෙසය. ඇමරිකානු උරුමයක් වීම මගින් තමන්ගේ ආර්ථික සහ දේශපාලන අභිලාෂයන් මුදුන් පත් කරගත් හැකි බව තේරුම්ගත් හෙයින් ඔවුහු නව ආක්‍රමනිකයාව සාදරයෙන් පිලිගත්හ. ඇමරිකානු යටත් විජිත ආන්ඩුව විසින් අවසානයේ දී අස්වාමික කරන ලද ක්‍රිස්තියානි නිකායයන්ගේ ඉඩම් හා විශාල මන්දිර මෙටිසිසෝ කතිපතන්ත්‍රය අතට පත්විය. දේපල හිමි පන්තියට පමනක් ඡන්ද බලය දැඩිව සීමා කරමින් තමන් ම ඉතා සමීපව අධීක්ෂනය කරන ලද නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක් නමැති එකක් ඇමරිකාව තහවුරු කලේ ය.

දෙවන ලෝක යුද්ධය වන විටත් ඡන්ද වරම හිමි වී තිබුනේ ජනගහනයෙන් සියයට 14 පමනි. ඇමරිකාව මැනිලාවේ පිහිට වූ ද්වි-මන්ඩල ව්‍යවස්ථාදායකය ව්‍යාප්ත වෙමින් පැවැති සිවිල් සේවයේ තනතුරු ලබා ගැනීමට අධිපති ප්‍රභූවට මග පෑදූ අතර ඔවුන්ට තමන්ගේ ප්‍රදේශවල බලය වර්ධනය කර ගැනීමට එය උපකාරී විය.

ජපාන ආක්‍රමනයෙන් සහ දෙවන ලෝක යුද්ධයට පසුව ඇමරිකාව පිලිපීනයට නාමික නිදහස ලබා දුන් නමුදු සාම ගිවිසුම් පද්ධතියක් මගින් දූපත් මත සැලකිය යුතු ආර්ථික පාලනයක් රඳවා ගත්තේ ය. ඍජු ඇමරිකානු පාලනය අවසන් වීමත්, මධ්‍යම රජය ක්ෂනිකව දුබල වීමත් සමග වංශාධිපතීන්ගේ දේශපාලනයට වසන්ත කාලය උදා විය. ග්‍රාමීය සහ නාගරික පාදඩ කන්ඩායම්වලින් ආකර්ශනය කරගන්නවුන්ගෙන් වංශාධිපති පවුල් පෞද්ගලික හමුදා ගොඩ නගා ගත්හ. මැතිවරන හුදෙක් දූෂිත පමනක් නොවීය. ඒවා තම ප්‍රතිවාදීන් ඝාතනය කරන ලද ලේ වැකි ගනුදෙනු වූ අතර ඡන්ද දායකයින්ට නිරන්තරව ම තර්ජනය කරනු ලැබීය.

ඇමරිකානු විජිතවාදී පාලන සමය තුලදී ප්‍රධාන පවුල් බොහොමයක් ඇමරිකානු වෙලඳපොල සබඳතා හරහා තම ධනය රැස් කර ගත්හ. පශ්චාත් නිදහස් කාල පරිච්ඡේදය තුල දී ක්‍රමයෙන් පැනවූ තීරුබදු සහ වෙලඳ බාධක මගින් මොවුන්ගේ ලාබයට තියුනු ලෙස පහර වැදුනේ ය.

රාජ්‍යයේ මූල්‍ය බලය හැසිරවීම මගින් වංශාධිපතියෝ මේ සඳහා වන්දි ලබා ගත්හ. ආර්ථික නිදහස සහ ආනයන ආදේශිත කාර්මිකරනය ප්‍රවර්ධනය කිරීමේ මුවාවෙන් විනිමය අනුපාතය හසුරුවනු ලැබීය. ඒකාධිකාරී බලපත්‍ර බෙදා දෙන ලදී. විශාල, හා ලාබ බැංකු නය අනුමත කල අතර වාසි ගෙන දෙන ප්‍රාදේශීය දේශපාලන ව්‍යාපෘති සඳහා ජාතික අයවැය ඉවක් බවක් නැතිව යෙදවීය. වඩාත් ව්‍යාපාරික

වංශාධිපතීන්ගෙන් සමහරක් නාගරික දේපල වෙළඳම, හෝටල් ප්‍රයෝජ්‍යතා රක්ෂන, ජනමාධ්‍ය සහ ඒ ආදී තවත් දේවල් තුල විවිධාංගකරනය වූහ. (බෙනඩික්ට් ඇන්ඩර්සන්, *The Spectre of Comparisons,* ද ස්පෙක්ටර් ඔෆ් කම්පැරිසන් හි "කැසික් ඩිමොක්‍රසි ඉන් ද පිලිපයින්ස්", ලන්ඩන් වර්සෝ, 1998, පිටුව, 208) ආත්මාර්ථකාමී උවමනාවන්ට සේවය කරන ජාතිකවාදී වාක්‍ය බන්ධ සහ හිස් වචන දෙඩවීමට දේශපාලනඥයෝ ඉගෙන ගත්හ.

## ෆර්ඩිනන්ඩ් සහ ඉමෙල්ඩා මාකෝස්

මාකෝස් ඉතාමත් බුද්ධිමත් විය. ඔහුටත් ඔහුගේ බිරිඳටත් අසීමිත අභිලාෂයන් තිබුන අතර ඔවුන් දෙදෙනාම පිලිපීන දේශපාලනයේ අධිකාරය දැරීමට කතිපතන්ත්‍රයේ පහල මට්ටමේ සිට ඉහලට නැග ගත්තවුන් වූහ.

මාකෝස් ඉඩම් හිමි ප්‍රභූ දේශපාලඥයන් සහ ඔවුන්ගේ පෞද්ගලික හමුදා භට කන්ඩායම්වලට එරෙහිවත්, පිලිපීනය තුල නොතිබුනු, 1960 ගනන්වල නිෂ්පාදිත කොමියුනිස්ට්වාදී තර්ජනයකට එරෙහිවත් උද්වේගකර උද්ඝෝෂනයක් ගෙන ගියේය.

හොඳින් ක්‍රියාත්මක වන රාජ්‍යයක් තුල තාක්ෂනාධිපතියන් වීමේ අභිලාශයෙන් සිටි නාගරික මධ්‍යම පන්තියේ සහයෝගය ඔහු දිනා ගත්තේ ය. උතුරු පිලිපීනයේ ඉලොකනො භාෂාව කථා කරන ප්‍රදේශයකින් පැමිනි මාකෝස්, ඉලොකනො ගොවි ජනතාවගේත්, සමහර නාගරික දුගී කන්ඩායම්වලත් සහයෝගය දිනාගැනීමට සමත් විය. 1965 දී මාකෝස් බලයට පත් කල ඔහුගේ සමාජ පදනම වූයේ මෙයයි.

ෆර්ඩිනන්ඩ් සහ ඉමෙල්ඩා යන දෙදෙනාම, එකිනෙකා අත් වැල් බැඳ ගනිමින්, විමතියට පත් කරනවන සාර්ථකත්වයකින් තම පෞද්ගලික ධනවත් වීමට ජනාධිපති බලය භාවිතා කලහ. රූමත් මෙන්ම විච්චූරන ලෙස හැඩ වූ ඉමෙල්ඩා ලෝක නායකයින් හමුවෙමින් ද සාප්පු සවාරි යමින් ද ලොව වටා සැරිසැරීය. ෆර්ඩිනන්ඩ් හමුදා බලඇනිය නාටකාකාර ලෙස ප්‍රසාරනය කරමින් තමන්ට නය ගැති ඉලොකනො නිලධාරීන් පහල මට්ටමේ සිට උසස් කරමින් තම දේශපාලන බලය ස්ථාපිත කර ගන්නා ලදී. කලක් ඉඩම් හිමි ප්‍රභූන්ට පමනක් සීමා වූ සුඛෝපභෝගී ජීවිත දැන් ඉහල හමුදා ප්‍රභූන් ද භුක්ති වින්දෝ ය. තම දේශපාලන ප්‍රතිවාදීන්ගෙන්, හමුදා නීතිය යටතේ, රජයට පවරාගත් දේපල, මාකෝස් තම විශ්වාසවන්ත හමුදා ජෙනරාල්වරුන්ගේ පාලනය යටතේ තැබුවේය. එමෙන්ම දේශපාලනකරනය වූ හමුදාව මාකෝස්ගේ වාර්ගික ඥාති සංග්‍රහය මගින් ඉරිතැලී ගොස් තිබිනි.

මාකෝස්ගේ විදේශ ප්‍රතිපත්ති බොහෝමයක් මෙහෙයවනු ලැබුවේ ඉමෙල්ඩා මාකෝස් විසින් ය. ලෝක නායකයන් මුනගැසුන ඇය රාජ්‍ය තාන්ත්‍රික උපායයන් සහ පෞද්ගලික වංචනිකත්වය භාවිතා කරමින් - හමුදාමය, දේශපාලන සහ මූල්‍යමය - ආධාර ලබාගත්තීය. තමන්ගේ අභිලාශය ඉටු කරවා ගැනීමේ දී බොලඳකමක් ඇය පෙන්වීය. චාටු බස් දොඩමින්, ආල හැඟුම් පාමින්, ඇය ඇමරිකානු ජනාධිපතිවරු පස් දෙනෙකුව පෞද්ගලිකව ම හමු වූ අතර නැන්සි රීගන්ගේ කුලුපග මිතුරියක වූවාය.

ඇයට සහ ඇගේ සැමියාට කිසිදු ඇමරිකානුවෙකුට තිබුනාට වඩා ඇමරිකානු දේශපාලනය හා එහි අභ්‍යන්තර හා බාහිර ප්‍රතිපත්ති ගැනත් මනා අවබෝධයක් තිබුනේ ය. ප්‍රති-කොමියුනිස්ට් භීතිය භාවිතා කරමින් සහ පිලිපීනයේ ඇති ඇමරිකානු කඳවුරු වල බදු කරය දීර්ඝ කිරීමට ඇති බාධක ගැන නිතරම ලජ්ජාශීලී ලෙස මුකුලු කරමින් හා ඇමරිකානු දේශපාලකයන් වෙත උපාමාරු දමමින් ඔව්හු මෙම අවබෝධය තමන්ගේ වාසියට යොදාගත්හ.

1968 නික්සන්ගේ මැතිවරන උද්ඝෝෂනයට ඩොලර් මිලියන 1 ක් ද 1972 දී තවත් ඩොලර් මිලියනයක් ද මාකෝස්වරු පරිත්‍යාග කලහ. ඇත්ත වශයෙන්ම මෙම මුදල් ලබාගත්තේ පිලිපීන රාජ්‍ය භාන්ඩාගාරයෙනි.

පිලිපීනයේ උද්ධමනය සියයට 18 ඉහල නැගීමට තුඩුදුන්, අදහා ගත නොහැකි මුදල් සම්භාරයක් තම උද්ඝෝෂනය සඳහා විනාශ කරමින් මාකෝස් 1969 දී දෙවන පාලන කාලය මිලට ගත්තේ ය. උද්ධමනය සමග පොර බැදීමට පිලිපීනයේ ඇමරිකානු හමුදා කඳවුරු සඳහා බදු කුලියෙන් ඩොලර් මිලියන 100 ක අත්තිකාරම් මුදලක් මාකෝස් ලබා ගත්තේ ය.

ඇමරිකානු ව්‍යවස්ථාවට අනුව ඍජුව සකසනු ලැබූ පිලිපීන ව්‍යවස්ථාව ඕනෑම ජනාධිපති වරයෙකුගේ පාලනය වාර දෙකකට සීමා කරනු ලැබීය. 1973 දී නියමිතව තිබූ ඊලඟ මැතිවරනය මාකෝස්ගේ සිතේ තදින්ම හොල්මන් කලේ ය. පාලන කාලය සඳහා ඇති සීමාවන් ඉවත් කිරීමට ඔහු 1971 දී ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කිරීමට වෙර දැරීය. නිනොයි අක්විනො මූලිකත්වය ගත් ප්‍රතිවාදී දේශපාලන පවුල් වලින් එල්ල වූ දැඩි විරෝධය හමුවේ ඔහුගේ සංශෝධන වෑයම ව්‍යවර්ථ විය. නීතිමය යාන්ත්‍රනයට බාධා එල්ල වූ හෙයින් ඔහු හමුදා නීතිය ප්‍රකාශයට පත් කලේ ය.

ජෙනරාල්වරුන්ගේ කවුන්සිලයක් සහ සිවිල් නිලධාරීන් දෙදෙනෙකු ද, කොරිගෙ උග්‍ර ප්‍රතිවාදියෙකු හා ඥාති සොහොයුරකු වූ එඩුඅර්ඩො "ඩැන්ඩින්ග්" කොජුඅන්ග්කො, සහ ආරක්ෂක ඇමති ජුවන් පොන්සෙ එන්රයිල්, සමග වැඩ කරමින් මාකෝස් තම ප්‍රකාශය රහසිගතව සූදානම් කලේ ය. ඔහු සුහර්තෝගේ ජෙනරාල්වරුන්ගෙන් උපදෙස් ගත්තේය. මොව්හු ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂයේ ආධාරකරුවන්

සහ සාමාජිකයින් 500,000 ත් ලක්ෂ 10 ත් අතර සංඛ්‍යාවක් සමූල ඝාතනය කරමින් රුදුරු ලේ ගංගාවක් මතින් 1965 බලය උදුරා ගත්තෝ වූහ.

1972 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී, මැනිලාව පුරා ප්‍රසිද්ධ ව්‍යාපාරික සහ ආන්ඩු ගොඩ නැගිලි අවට මධ්‍යම රාත්‍රියේ බෝම්බ පිපිරීම් මාලාවක් සිදු විය. මෙම බෝම්බ පිපිරීම් මෙහෙය වූ මාකෝස් කොමියුනිස්ට්වරුන්ට ඒ ගැන චෝදනා එල්ල කලේ ය. හමුදා නීතියේ ප්‍රධාන සැලසුම්කරුවා වූ එන්රයිල් තමන්ගේම රථ පෙලට ප්‍රහාරයක් එල්ල කරවී ය. මෙහිදී තමන්ගේම වාහනය වෙත ද තුවක්කුකරුවකු විසින් ප්‍රහාරයක් එල්ල කරවීමට ඔහු විසින් සැලසුම් කර තිබුනේය.

ඔහු තම ආරක්ෂක භට කන්ඩායම සමග වෙනත් වාහනයක ගමන් කලේය. කොමියුනිස්ට්වාදීන්ට නැවතත් චෝදනා කල මාකෝස් හමුදා නීතිය ප්‍රකාශයට පත් කරමින් 1081 ප්‍රකාශනයට අත්සන් තැබූ අතර තම සියලුම දේශපාලන ප්‍රතිවාදීන් අත් අඩංගුවට ගැනීමට හමුදා භටයින් පිටත් කලේ ය. පලමුව අත් අඩංගුවට ගනු ලැබුවේ නිනොයි අක්විනෝ ය.

බොහෝ පැතිවලින් ගත් කල අක්විනෝ මාකෝස් මෙන්ම ආකර්ශනීය දේශපාලකයකු වූයේය. ඔහුගේ දේශපාලන ජීවිතය තුල වාර්තා පෙලක් විය. ඔහු වඩාත්ම ලාබාල පුරපති ද වඩාත්ම ලාබාලම උප-ආන්ඩුකාරයා ද වූ අතර, වයස 35 දී, පිලිපීන ඉතිහාසයේ ලාබාලම සෙනේට් සභිකයා ද වූයේය. ඔහු කැපී පෙනෙන සුලු දේශපාලන පවුලකින් පැවැත එන්නෙකු විය.

ඔහුගේ පියා ජපාන ආක්‍රමන යුගයේ දී මන්ත්‍රන සභාවේ කථානායක වී සිටියේ ය. යලි පැමිනෙමින් සිටි ඇමරිකානු හමුදාව සහ අලුතෙන් නිදහස ලැබූ පිලිපීනයේ ප්‍රථම පරිපාලනය විසින් ප්‍රභූ ආධාරකරුවන්ට සමාව ප්‍රදානය කලේ ය. එහෙත් ඇමරිකානු හමුදා නොසිටි කාල පරිච්ඡේදය තුල ජපානයට විරුද්ධව සටන් කල ගොවි හමුදාව වූ හකබලාප්වරුන්ට සැලකුවේ දුෂ්ට ආකාරයට ය. ඔවුහු තොග වශයෙන් නිරායුධ කල අතර සමහරු අත්අඩංගුවට ගත්හ.

අනුගාමිකයන් ආකර්ශනය කර ගැනීමේ හැකියාවට සහ දේශපාලන ප්‍රමුඛත්වයට අමතරව, නිනොයි ට කොජුඅන්ග්කො පවුලේ අරමුදල් ද තිබින. 1973 දී ජනාධිපති විය යුතුව තිබුනු නමුත් ඔහු සිටියේ අගුයිනල්ඩො කඳවුරේ සිර කුටියක් තුල ය.

හබෙයාස් කෝපුස් රිට් ආඥාව අත් හිටවූ මාකෝස් විරුද්ධවාදීන් දහස් සංඛ්‍යාවක් අත් අඩංගුවට ගත්තේය. තම ප්‍රතිවාදී පවුල්වල දේපල උදුරා ගනිමින් ද, තම ගැත්තරයින්ට ඒවායෙහි පාලනය මාරු කරමින් ද, මාකෝස් ඔවුන්ව කොල්ල කැමෙහි යෙදුනේය. කතිපතන්ත්‍රයේ යම් කන්ඩායමක් මාකෝස් යටතේ පෝෂනය වූ අතර සෙස්සෝ කොල්ල කෑමට ගොදුරු වූහ.

මහජන විරෝධය මෘග ලෙස මර්දනය කරනු ලැබීය. පුද්ගල පැහැර ගැනීම්, වධ දීම් සහ නඩු නැතිව ඝාතනය කිරීම් හමුදාව විසින් නිරන්තරව සිදු කෙරින. මෙම මර්දන ව්‍යාපෘතිය 'ගලවාගැනීම' නමින් ප්‍රකට විය. 1970 දශකය දිගහැරෙද්දී මාකෝස්ට තමන්ගේ පන්ති සහයෝගි පදනම අහිමි විය.

තාක්ෂනික ආධිපත්‍ය දරා සිටීමේ අභිලාෂයන් සිටි තාක්ෂනික විශේෂඥයන් හා නාගරික මධ්‍යම පන්තියේ ව්‍යාකුලත්වය ක්‍රමානුකූලව පහවෙමින් තිබුනි. පිටිසර සිට සංක්‍රමනය වූවන්, තමන්ගේ හිස් පහත් කිරීමට ද නිශ්ශබ්දව හා නිශ්ක්‍රියව සිටීමට අකැමැති වූවෝ මාකෝස් තන්ත්‍රයේ අවසානයක් දෙස බලා සිටියහ. දැන් මාකෝස්ගේ බලය පදනම් වූයේ තමන් බලයට පැමිනි දා සිට තුන්ගුනයකින් ව්‍යාප්ත වූ හමුදාවේ ඍජු පාලනය මත ය.

හමුදා නීතිය මගින් කන්ඩායම් 2ක් පෝෂනය වූහ. හමුදාවත්, පිලිපීන කොමියුනිස්ට් පක්ෂය (සීපීපී) සහ එහි ආයුධ සන්නද්ධ අංශය වූ නව මහජන හමුදාවත් (එන්පීඒ) ය.

## පිලිපීන කොමියුනිස්ට් පක්ෂය (සීපීපී) සහ හමුදා නීතිය.

පාර්ටිඩො කොමිනිස්ත න්ග් පිලිපිනාස් (පීකේපී) යන ටැගලොග් නමින් හැඳින්වෙන ස්ටැලින්වාදී පිලිපීන කොමියුනිස්ට් පක්ෂය, 1950 දශකය මැද වන විට, එක තැන පල්වීමේත් දියවීයාමෙත් කාල පරිච්ඡේදයකට ඇතුල් වී තිබින. හුක්බො මපග්පලායා න්ග් බයන් (එච්එම්බී) නමින් හැඳින්වූ පීකේපී හි ගරිල්ලා හමුදාවේ (දෙවන ලෝක යුද්ධයෙන් පසු නැවත හැඩ ගැස්වූ හුක්බලහප් ගොවි ජනතාව) කැරැල්ල මග්සයිසයි පරිපාලනය විසින් මනෝවිද්‍යාත්මක යුද්ධයක් හා යටත් වන "හක්වරුන්" සඳහා ඉඩම් ප්‍රතිසංස්කරනයේ සීමිත වැඩපිලිවෙලක් ඒකාබද්ධව භාවිතා කිරීම මගින් සාර්ථකව මැඩ පවත්වන ලදී.

මෙම වැඩපිලිවෙල සහ මැග්සයිසයිගේ ජනාධිපති අපේක්ෂකත්වය සී.අයි.ඒ ක්‍රියාධරයකු වූ එඩ්වර්ඩ් ලැන්ස්ඩේල් විසින් මැනවින් සැලසුම් කරන ලදි. 1957 දී ඒ වන විටත් ගරිල්ලා යුද්ධයේ සිට නීතිමය අරගලයක් දක්වා තම උපායයන් වෙනස් කර තිබූ පීකේපී නායකත්වය "එහි තනිපෙල" ප්‍රතිපත්තිය නිවේදනය කලේ ය. සියලුම පක්ෂ කාඩර්වරු සෙසු පක්ෂ සාමාජිකයින් එක් කෙනෙක් සමග පමනක් සම්බන්ධය තිබිය යුතුවූ අතර නියෝග ලබාදුන්නේ ද "තනි පෙල" ක්‍රමයට වාචිකව ය. සාරභූත වශයෙන්ම, පී.කේ.පී යේ පක්ෂ ජාලය සහ සංවිධානාත්මක කන්ඩායම් ස්වයං

දියකර හැරීමකට භාජනය කලේය. නීතිමය අරගලයේ යෙදී සිටින්නවුන්ගේ ආරක්ෂාව සඳහා පුද්ගලික ආරක්ෂකයින් ලෙස ගරිල්ලා ඒකක කිහිපයක් පවත්වාගෙන ගියේය. මෙම ආරක්ෂා කර ගන්නා ලද ඒකකයන් අතර නව මහජන හමුදාව නම් (එන්පීඒ) ආරම්භක ඒකකය වූ කුමන්දර් දාන්තෙගේ මධ්‍යම ලුසොන් ප්‍රාන්ත බලඇනිය ද විය.

1950 දශකයේ දී පිලිපීන සමාජය හරහා එක විටම ධනේශ්වර ජාතිකවාදී දේශපාලනයත්, ශිෂ්‍ය කැරැල්ලත් හමා ගිය විට පිලිපීන කොමියුනිස්ට් පක්ෂය මරනාසන්න සංවිධානයක් වී තිබින. මෙය 1960 දශකය පුරාම රෝගීභාවයෙන් පැවතින. එල්.බී.පේ සහ නික්සන් සමග සිදුකල පෞද්ගලික සාකච්ඡාවල දී ඉමෙල්ඩා මාකෝස් උමතු ලෙස කොමියුනිස්ට් පක්ෂය හෙලා දුටු අතර හමුදා ආධාර ලෙස ඩොලර් මිලියන ගනන් ලබා ගත්තීය. නමුත් සියලු පරමාර්ථයන් සහ එල්ලයන්ගේ අර්ථයෙන් ගත් කල කොමියුනිස්ට් පක්ෂය මැරී තිබින.

ජොමා ලෙස හඳුන්වනු ලැබූ ජොසෙ මරිය සිසන් 1969 දී සීපීපී යන කෙටි නාමය යටතේ පිලිපීනයේ නව කොමියුනිස්ට් පක්ෂයක් ආරම්භ කලේය. ජොමා ඉලොකොස් හි ඉඩම් හිමි මෙස්ටිසො පවුලක දරුවකු විය. ඔහු හැදී වැඩුනේ 1950 දශකයේ වාචාල කථා පැවැත් වූ දේශපාලකයින්ගේ සෙවනේ හෙයින් ඔවුන්ගේ ජාතිකවාදයෙන් ඔහු දැඩිව ආවේශ ගැන්වුනේය.

1960 දශකයේ මුලදී කෙටි කලකට ඉන්දුනීසියාවට ගිය ඔහුට අයිදිට් යටතේ වූ පී.කේ.අයි හි මාවෝවාදය ඇසුරු කිරීමට හැකි විය. පිලිපීනයට පෙරලා පැමිනි ඔහු පී.කේ.පීය ට බැඳී ක්‍රියාකාරී තරුන කන්ඩායමක් ගොඩ නැගුවේය. ඔහුගේ ක්‍රියාවාදය සහ පැවැති නායකත්වය තියුනු ලෙස විවේචනය කිරීම නිසා කුපිත වූ මධ්‍යම කාරක සභාව, 1960 දශකය අගදී ඔහුව පක්ෂයෙන් නෙරපන ලදී.

1969 ජනවාරි ආරම්භයේ දී පන්ගසිනන් ප්‍රදේශයේ මන්ගතරෙම් හි පිටිසර ස්ථානයක ජොමා සිසන් ආධාරකරුවන් 11 සමග නව පිලිපීන කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කලේය. ජනවාරි 3 දින සම්මේලනය ආරම්භ කලද මාඕ සේතුංගේ උපන් දිනයට ගරු කිරීම සඳහා පොදු එකඟතාවයකින් සම්මේලනයේ දිනය 1968 දෙසැම්බර් 26 ලෙස සටහන් කර ගන්නා ලදී.

කොන්ග්‍රසයේ දී "වැරදි සෘදාගමු, පක්ෂය ගොඩනගමු" යන තේමාව යටතේ කලින් ලියන ලද වාර්තාවක් සිසන් ඉදිරිපත් කලේ ය. පිලිපීන සමාජය, අර්ධ වැඩවසම්වාදී සහ අර්ධ යටත්විජිත පන්නයේ නිෂ්පාදනයක් සහිත රටක් බවත්, "එකම සාර්ථක විසඳුම වන්නේ 'අනභිභවනීය නගරය වට ලැමට ගම භාවිතා කිරීමේ න්‍යායේ විශ්වීය සත්‍ය' යන අදහස මත පදනම් වූ 'දික් ගැසුනු මහජන යුද්ධයක්'" බව ඔහු ප්‍රකාශ කලේ ය.

මෙම "මහජන යුද්ධය" ගෙනයාම සඳහා මහජන හමුදාවක අවශ්‍යතාවය නිසා ජොමා සිසන් තවමත් පොර පිටියේ අවසාන වශයෙන් ඉතිරි වී සිටි එච්.එම්.බී ගරිල්ලාවරුන්ගෙන් එකෙකු වූ කුමන්දර් ඩාන්තෙ ලෙස හැඳින් වූ බර්නබෙ බුස්කයිනො ව සම්බන්ධ කර ගත්තේ ය. කුමන්දර් ඩාන්තෙගේ නායකත්වය යටතේ නව මහජන හමුදාව (එන්පීඒ) ලෙස 1969 මාර්තු 29 දින සී.පී.පී. යේ සන්නද්ධ අංශය ගොඩ නගන ලදී.

සී.පී.පී. - එන්පීඒ නොවැදගත් කුඩා සංවිධානයක් විය. මෙයට කන්ඩායමක් දිනා ගත නොහැකි වූ අතර කිසි දෙයක් ඉෂ්ට කර ගැනීමට ද නොහැකි විය. ඒ කෙසේ වෙතත්, යුද්ධ නීතිය ප්‍රකාශයට පත් කිරීමත් නිත්‍යානුකූල සංවිධාන මත කඩාපැනීම් සමග, බහුතරයකට දැනුනේ එන්පීඒ සහ කඳුවල සිටි ගරිල්ලා වරුන්ගේ ආයුධ සන්නද්ධ අරගලයට සම්බන්ධ වීම හැර විකල්පයක් නොමැති බව ය. සුලු ධනේශ්වර බුද්ධිමත්තු, අතෘප්තියට පත් වූ ගොවි ජනතාව සහ කම්කරු පන්තික නායකයෝ යන සිල්ලෝම "පිටිසර සිට නගරය වැටලීම" සඳහා පිටත් කර යවන ලදී. මාකොස් ඒකාධිපතිත්වය උග්‍ර කරන ලද තරමට ම, එන්පීඒ පෝෂනය විය. දෘෂ්ටිවාදීව බංකොලොත් වූ සීපීපීය ට හොඳම දෙය වූයේ යුද නීතිය ය. 1970 දශකය එන්පීඒ සාමාජිකත්වය 60 සිට 12,000 දක්වා වර්ධනය වූහ.

© www.wsws.org